අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

මගේ යොමුව / எனது குறியீடு / My Ref. PMO/RRPCM/2025/Cir

ඔබේ යොමුව / உமது குறியீடு / Your Ref.

දිනය / திகதி / Date 2026.03.03

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩල කළමනාකරණය සඳහා පත්කළ නිලධාරී කමිටුව වෙත තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අදාළව අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2025.02.28 දිනැති ලිපිය, ඇමුණුම (ආකෘති පත්‍රය) මෙම ලිපිය මඟින් සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙමි.

02. රාජ්‍ය සේවයට බඳවාගැනීම සම්බන්ධයෙන් වත්මන් රජයේ ප්‍රතිපත්තිවලට අනුගත වෙමින්, රාජ්‍ය ආයතන වෙත පැවරී ඇති කාර්යභාරය, අනුමත කාර්ය මණ්ඩලය තුළ දැනට පවතින තථ්‍ය තනතුරු සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව, මේ වනවිට අත්‍යවශ්‍ය තනතුරු 105,367ක් සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත.

03. ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව/ ව්‍යවස්ථාපිත ආයතනය/කොමිෂන් සභාව මඟින් මහජනතාව වෙත සපයනු ලබන සේවාවන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය යැයි ඔබ විසින් හඳුනාගනු ලබන කාර්යමණ්ඩල තනතුරුවල පුරප්පාඩු සඳහා බඳවාගැනීම් ඉල්ලීම් නිශ්චිත දිනයකට නිර්ණය කර, විධිමත් නිර්දේශයන් ද ඇතුළත්ව, මෙම ලිපියට අමුණා ඇති අයදුම්පත්‍රය ප්‍රකාරව සම්පූර්ණකොට අවශ්‍ය ඇමුණුම් ලේඛන ද සමඟ පහත යොමු හරහා මෙම කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස දන්වමි. තවද, මෙම ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ දී මා විසින් ඔබ වෙත යොමු කරන ලද අංක PMO/RRPCM/2025/decision හා 2025.12.11 දිනැති ලිපියේ උපදෙස් සම්බන්ධයෙන් ද අවධානය යොමු කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි (ඔබගේ පරිශීලනයේ පහසුව පිණිස ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා එවමි).

සභාපති,
රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩල කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ නිලධාරී කමිටුව
අංක 58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 07

ඉ-තැපැල - rrpcm@pmoffice.gov.lk

04. එමෙන්ම, අත්‍යවශ්‍ය කාර්යමණ්ඩල තනතුරුවල පුරප්පාඩු සඳහා බඳවාගැනීම් ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ මෘදු පිටපත pmoffice.gov.lk වෙබ් අඩවිය හරහා බාගත කිරීමට හැකියාව පවතින බව තවදුරටත් දන්වනු රිසියෙමි.

**ප්‍රදීප් සපුතන්ත්‍රී**
අග්‍රාමාත්‍ය ලේකම්
සභාපති, රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩල කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ නිලධාරී කමිටුව

පිටපත් :

| | |
|---|---|
| 1. ජනාධිපති ලේකම් | කරු. දැ.ගැ.ස. |
| 2. අමාත්‍ය මණ්ඩලයේ ලේකම් | |
| 3. අමාත්‍යාංශ ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | කරු. දැ.ගැ.ස. හා අ.ක.ස. |
| 4. අමාත්‍යාංශ ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | |
| 5. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව | |
| 6. ලේකම්, මුදල් කොමිෂන් සභාව | |
| 7. විගණකාධිපති | කරු. දැ.ගැ.ස. |
| 8. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව | කරු. දැ.ගැ.ස. හා අ.ක.ස. |
| 9. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | |
| 10. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | |